අවමංගල්ය පෙරහැරට සහභාගි වීම අපට තහනම් කර ඇති අතර, එය අපට නිර්දේශ කර නැත

උම්මු අතිය්යා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී: අවමංගල්ය පෙරහැරට සහභාගි වීම අපට තහනම් කර ඇති අතර, එය අපට නිර්දේශ කර නැත.
[صحيح] [متفق عليه]

උම්මු අතිය්යා අල්-අන්සාරියා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ දන්වා ඇත. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් අවමංගල්ය පෙරහැර සමඟ ගමන් කිරීම කාන්තාවන්ට තහනම් කළහ. ඊට හේතුව ඒ තුළින් ඔවුනට ඇතිවන හෝ ඔවුන් හේතුවෙන් ඇතිවන අර්බුදවලට බියවීම නිසාවෙන් සහ ඔවුන්ගේ ඉවසීමේ ඌනතාවය නිසාවෙනි. පසුව ඇය: සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් අනෙකුත් තහනම් කිරීම් සම්බන්ධයෙන් කළ පරිදි මේ ගැන වූ තහනම අවධාරණය නො කළ බව ද දන්වා සිටියා ය.

http://www.sunnah.global/hadeeth/si/show/3228